# දැව ප්‍රවාහනය සඳහා බලපත්‍රයක් ලබා ගැනීම.

සීමිත දැව ප්‍රවාහනය සඳහා බලපත්‍ර නිකුත් කරනු ලබන්නේ වන සංරක්ෂණ දෙපාතර්මේන්තුවෙනි. ප්‍රාදේශීය ලේකම් කායර්ාලය මගින් සීමිත යටත් නොවන දැව ප්‍රවාහනය සඳහා බලපත්‍ර ලබාදේ.

**සීමාවලට යටත් වන ගස් පහත සඳහන් වේ.**

- එබනි
- කළු මැදිරිය
- බුරුත
- හුලංහික්
- පලූ
- සූරිය මාර
- ගම් මාළු
- හල්මිල්ල
- මිල්ල
- වෙලන්
- පානක්ක
- කුඹුක්
- කොහොඹ
- මී

**සටහන**

- කලින් කලට,දිස්ත්‍රික්කයෙන් දිස්ත්‍රික්කයට වෙනස්විය හැකිය.
- කොටස් ගාන ලද දැව අලූත් ලී බඩු ජනෙල් රාමු ජනෙල් දොරවල් දොර රාමු, දොරවල් වැනි සීමාවලට යටත් නොවන දැව ප්‍රවාහනය සඳහා බලපත්‍ර ප්‍රාදේශීය ලේකම් කායර්ාල වලින් ලබා ගත හැකිය.

**සුදුසුකම්**

- ඉහත සඳහන් සීමාවලට යටත් වන දැව හැර වෙනත් දැව විය යුතුයි.
- දැව ලබා ගන්නා ඉඩම පෞද්ගලික ඉඩමක් විය යුතුයි.

**ඉදිරිපත් කිරීමේ ක්‍රියා මාගර්ය**

| | | |
|---|---|---|
| 1 | **ඉල්ලූම්පත්‍රයක් ලබා ගැනීම**<br>ඉල්ලූම්කරු ග්‍රාම නිලධාරී තුමාගෙන් ඉල්ලූම්පතක් ලබා ගැනීම<br>සෑම අංශයකින්ම ඉල්ලූම් පත සම්පූණර් විය යුතුයි. | ඉල්ලූම්පත දැව ප්‍රවාහනය සඳහා පාවිච්චි කරන ලද ලී බඩු අළුත් බඩු සඳහා බලපත්‍ර ඉල්ලීමේ ඉල්ලූම්පත |
| 2 | **අවශ්‍ය කරන ආධාරක ලියකියවිලි**<br>• දැව ලබගත් ඔප්පුවේ/ප්‍රදාන ඔප්පුවේ/බලපත්‍රයේ අනුමත කරන ලද කොපියක්<br>• දැව ලබාගනු ලබන ඉඩම රජයේ නොබෙදූ ඉඩමකට/රක්‍ෂිතයකට මායිමීවේ නම් ඉඩමේ මිනින්දෝරු රේඛා සැලැස්මෙහි මුල් පිටපත<br>• දැව ලබා ගත්තේ වෙන්දේසියකින් නම් එම කුවිතාන්සිය<br>• දැව මිලයට ගනු ලැබුයේ නම් ග්‍රාම නිලධාරී විසින් සහතික කරන ලද කුවිතාන්සිය<br>• පරිත්‍යාගයක් වශයෙන් ලැබුනු දැව නම් ඒ පිළිබඳව ග්‍රාම නිලධාරී විසින් සහතික කරන ලද ලිපිය.<br>• දැව කැපීම සඳහා ලබාගත් බලපත්‍රය | |

| | |
|---|---|
| 3 | **ඉල්ලුම්පත භාර දීම**<br>සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත ග්‍රාම නිලධාරී වෙත භාර දීම<br>ඉන්පසු ග්‍රාම නිලධාරී විසින් එම ඉල්ලුම්පත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත භාර දීම. |
| 4 | **සැ.යු:** ඉඩමේ අයිතිය තහවුරු කිරීම සඳහා ඔප්පුව අවශ්‍ය වේ. |

**ඉල්ලුම් පත්‍ර පෝරම**

| **ඉල්ලුම් පත් අංකය / නම** | **විස්තර** |
|---|---|
| දැව, අළුත් ලී බඩු, පාවිච්චි කරන ලද ලී බඩු, ප්‍රවාහනය සඳහා අවසර ඉල්ලීමේ ඉල්ලුම් පත | සීමාවලට යටත් නොවන දැව ප්‍රවාහනය සඳහා බලපත්‍රය |

**පියවරෙන් පියවර ක්‍රියාවලිය** (දැව ප්‍රවාහනය සඳහා බලපත්‍ර ලබා ගැනීම)
**පියවර 1:** ඉල්ලුම්කරු ග්‍රාම නිලධාරීගෙන් ඉල්ලුම් පතක් ලබා ගැනීම
**පියවර 2:** ඉල්ලුම්කරු අවශ්‍ය කරන ලිපි ද්‍රව්‍ය සහ ගාස්තු සමඟ සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත ග්‍රාම නිලදාරී වෙත භාර දෙනු ලබයි.
**පියවර 3:** ග්‍රාම නිලධාරී වාතර්ාවක් සපයා එය ඉල්ලුම් පතට අමුණයි.
**පියවර 4:** ග්‍රාම නිලධාරී අවශ්‍ය කරන ලියකියවිලි සහිත ඉල්ලුම් පත අදාළ ප්‍රාදේශීය ලේකම් කායර්ාලයට භාර දෙයි.
**පියවර 5:** ප්‍රාදේශීය ලේකම් කායර්ාලය මගින් ඉල්ලුම් පත හා අනෙක් ලියකියවිලි වන සංරක්ෂණ දෙපාතර්මේන්තුව වෙත යවයි.
**පියවර 6:** වන සංරක්ෂණ නිලදාරි විසින් මේ ගැන සොයා බැලීම සඳහා එහි ගොස් වාතර්ාවක් සපයා අනුමත හෝ විරුද්ධත්වය ප්‍රකාශ කොට එම වාතර්ාව අදාළ ප්‍රාදේශීය ලේකම් කායර්ාලය වෙත යවයි.
**පියවර 7:**ග්‍රාම නිලධාරී අදාළ ප්‍රාදේශීය ලේකම් කායර්ාලයෙන් අදාළ බලපත්‍රය මුදල් ගෙවා ලබා ගනී.
**සැ.යු.** 2 ඉල්ලුම්කරුට කෙලින්ම ප්‍රාදේශීය ලේකම් කායර්ාලයෙන් බලපත්‍රය ලබා ගත නොහැක.
**සටහන්:** වන සංරක්ෂණ සංරක්ෂන නිලදාරි එම ඉල්ලුම් පත හා ලියකියවිලි පිළිබඳ සෑහීමකට පත් නොවන්නේ නම් ඔහුගේ ඉල්ලීම ප්‍රතික්ෂේප වේ.

**කාලසීමාව**

**ක්‍රියාවලියේ කාලසීමාව**
ප්‍රාදේශීය ලේකම් කායර්ාල බල පත්‍ර නිකුත් කරයි _ සති 2
දැව ප්‍රවාහනය කරන කාලය, පෙ.ව. 6.00 _ ප.ව. 6.00
(සෙනසුරාදා, ඉරිදා හා රජයේ නිවාඩු දිනහැර)

**භාර දීමේ කාලසීමාව :** අදාළ නොවේ
**සැ යු.** ඉල්ලුම්පත ග්‍රාම නිලධාරී වෙත භාර දිය යුතුය

**වලංගු කාලසීමාව**
බලපත්‍රයේ සඳහන් දින හා වේලාව අතරතුරදී පමණි.

**වැඩ කරන කාලය හා දින**
ප්‍රාදේශීය ලේකම් කායර්ාලය (අයතන අංශය)
පෙ.ව. 9.00 _ ප.ව. 4.30 සඳුදා හා බදාදා

**සේවය සඳහා ගෙවීම**
දැව ප්‍රවාහන ගාස්තු ප්‍රවාහනය කරන වාහනය අනුව වෙනස් වේ.
කර තබා ප්‍රවාහනය සඳහා ගාස්තු නොමැත.

| | |
|---|---|
| කරත්ත සඳහා | රුපියල් 150.00 |
| අත් ට්‍රැක්ටරය | රුපියල් 150.00 |
| ට්‍රැක්කටර් | රුපියල් 150.00 |
| ලොරි | රුපියල් 150.00 |

**අවශ්‍ය අමතර ලියකියවිලි**

- දැව ලබගත් ඔප්පුවේ/ප්‍රදාන ඔප්පුවේ/බලපත්‍රයේ අනුමත කරන ලද කොපියක්
- දැව ලබාගනු ලබන ඉඩම රජයේ නොබෙදූ ඉඩමකට/රක්ෂිතයකට මායිම්වේ නම් ඉඩමේ මිනින්දෝරු රේඛා සැලැස්මෙහි මුල් පිටපත
- දැව ලබා ගත්තේ වෙන්දේසියකින් නම් එම කුවිතාන්සිය
- දැව මිලයට ගනු ලැබුයේ නම් ග්‍රාම නිලධාරී විසින් සහතික කරන ලද කුවිතාන්සිය
- පරිත්‍යාගයක් වශයෙන් ලැබුනු දැව නම් ඒ පිළිබඳව ග්‍රාම නිලධාරී විසින් සහතික කරන ලද ලිපිය.
- දැව කැපීම සඳහා ලබාගත් බලපත්‍රය

**සේවය සඳහා වගකීම**

| තනතුර | අංශයේ නම |
|---|---|
| ප්‍රාදේශීය ලේකම් | අදාළ ප්‍රාදේශීය ලේකම් කායර්ාලය |
| ග්‍රාම නිලධාරී | අදාල ග්‍රාම නිලධාරී කොට්ඨාශය |

**විශේෂ කරුණු**
**බලපත්‍ර කාලසීමාව දීඝර් කිරීම**
වෙනත් ප්‍රදේශය ලේකම් කායර්ාලයකින් නිකුත් කල බලපත්‍රයක් සම්බන්ධයෙන්
බලපත්‍රයේ සඳහන් කරුණු ලැබූ කාලය වාහනයේ දෝෂයක් නිසා අතරමගදී වැඩිපුර කාලයක් ගත වන්නේ නම් අදාළ ප්‍රදේශයේ පොලීසියට දැනුම් දී අදාළ ප්‍රාදේශීය ලේකම් කායර්ාලයට තමා සතු බලපත්‍රය පොලිස් වාතර්ාව ඉදිරිපත් කොට අවසර ලබා ගත යුතු වේ.

**දත්ත තොරතරු සහිත ආදශර් ඉල්ලුම් පත**
අයැදුම්පතෙහි 2 වන කොටස ග්‍රාම නිලධාරී විසින් සම්පූණර් කල යුතුය